**මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘතිය - 2 - 2013**

---------------------------------------------------------------------------

මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘතිය-2 හි 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.) සහ චීන සංවර්ධන බැංකු සහයෝගීතාවය (චී.සං.බැ.ස.) අතර 2011 මාර්තු 31 දින එළඹි අංක 4500062212011110472 දරන ණය පහසුකම් ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

ණය පහසුකම් ගිවිසුමට අනුව මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ) මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘතිය 2 හි, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු යටතේ අරමුණුගත ප්‍රමුඛතා මාර්ග කිලෝමීටර 589.9 ක් වැඩිදියුණුව හා පුනරුත්ථාපනය ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුම අනුව ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 556 ක් වූ අතර එයින් රු. මිලියන 55,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් එනම්, සියයට 90 ක් චීන සංවර්ධන බැංකු සහයෝගීතාවය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූනි 28 දින ආරම්භ කළ අතර 2014 ජූනි 28 දිනට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

----------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය

මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් නිර්නායකයන් සිදුකර ඇති බව සහ

(ඌ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් නිර්නායකයන් සිදුකර ඇති බව සහ

(ඈ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

-------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.මිලියන 23,577 ක වටිනාකමක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 52,902 ක වටිනාකමක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | (15,951) | 147,064 | 133,723 |
| කෙරීගෙන යන වැඩ | 32,318,424,335 | 16,100,660,630 | 48,851,211,645 |
| | 32,318,408,384 | 16,100,807,694 | 48,851,345,368 |

## 5. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-------------------------------------

### 5.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුම අනුව ලබාදීමට එකඟ වූ වටිනාකම | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | % |
| වී.සං.බැ.ස. | 500 | 55,250** | 10,830 | 108.30 | 10,830 | 300.60 | 30,060 | 54.40 |
| ශ්‍රී.ලං.ර | - | 6,188 | 1,850 | 18.49 | 1,849 | 43.30 | 4,330 | 69.97 |
| | 500 | 61,438 | 12,680 | 126.79 | *12,679 | 343.90 | *34,390 | |

* වසර අවසානයට ගෙවිය යුතු වියදම්, රදවා ගත් මුදල් සහ අන්තර් ජංගම ගිණුම්වල ගණුදෙනු ඇතුළත් නොකිරීම නිසා මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දක්වා ඇති වටිනාකම් සමඟ මෙම වටිනාකම් වෙනස්ය.

** එකගවූ ණය වටිනාකම 2011 මාර්තු 31 දින පැවති එ.ජ.ඩොලරයට රු.110.5 ක රේටයට පරිවර්තනය කර ඇත.

**5.2 භෞතික ප්‍රගතිය**

-------------------

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල ඡේද අංක 4.4 ප්‍රකාරව මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා උප කොන්ත්‍රාත්කරුවන් සේවයේ යෙදවීමට කොන්ත්‍රාත්කරුවන්ට අවසර දී නොමැත.කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු රු. මිලියන 7,275 ක් වටිනා කොන්ත්‍රාත් තුනක වැඩ වෙනුවෙන් උප කොන්ත්‍රාත්කරුවන් සේවයේ යොදවා තිබුණි. තවද, උප කොන්ත්‍රාත්කරුවන් උපදේශකයින්ගේ ඍජු පාලනය යටතට ගෙන නොතිබුණි

(ආ) ව්‍යාපෘතියේ මාසික ප්‍රගති වාර්තා අනුව, මාසික වැඩ සම්පූර්ණ කිරීමට හැකිවන ලෙස කොන්ත්රාත්කරුවන් ප්‍රමාණවත් මානව සහ අනෙකුත් සම්පත් යොදවා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග කිහිපයක පුනරුත්තාපන වැඩ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම්කර තිබූ බව පහත විස්තරයෙන් දැක්වේ.

| මාර්ගයේ නම | 2013 දෙසැම්බර් 31 දිනට ඉලක්ක | තථ්‍ය ප්‍රගතිය | අඩුවීම |
|---|---|---|---|
| | % | % | % |
| හොරවෙල-පැලවත්ත-පිටිගල මාර්ගය (සීඅයිඒ) | 100 | 64.20 | 35.8 |
| හොරණ-අගුරුවාතොට-අළුත්ගම මාර්ගය (සී4) | 100 | 71.30 | 28.7 |
| හොරවෙල-පැලවත්ත-පිටිගල මාර්ගය (සී4සී) | 100 | 82.71 | 17.29 |
| පාලම ඉදිකිරීම තිරුවානකැටිය-අගලවත්ත මාර්ගය (සී21) | 100 | 63.56 | 36.44 |
| නාගොඩ-කළවැල්ලාව-බෙල්ලපිටිය මාර්ගය (සී20) | 89.38 | 58.36 | 31.02 |
| බදුල්ල-කරමැටිය-ආදාඋල්පත මාර්ගය (සී2බී) | 100.00 | 81.36 | 18.37 |
| තැන්නකුඹුර-රිකිල්ලගස්කඩ-රාගල මාර්ගය (සී11) | 73.80 | 54.67 | 19.13 |
| නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග (සී17) | 95.13 | 72 | 23.13 |

**5.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) ගල්කුලම - අනුරාධපුර මාර්ගයේ පුනරුත්ථාපන වැඩවල සංශෝධිත වැඩ සටහනට අනුව, විෂය පථය සැලකිය යුතු ලෙස වෙනස් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒබීසී ස්ථරය සහ අතුරු පාදමේ ස්ථරය මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා භාවිතා කළ ප්‍රමාණයන් මූලික ප්‍රමාණ පත්‍රයේ දක්වා ඇති ප්‍රමාණයන්ට වඩා පිළිවෙලින් සියයට 15 සහ සියයට 500 කින් වැඩිකර තිබුණි. තවද රු.99,348,518 ක් වටිනා කාණු, අඩි පාරවල්, පදික වේදිකා ආදී පුනරුත්ථාපන වැඩ නිම කිරීමට නියමිත 2013 සැප්තැම්බර් 12 දිනට සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් කොන්දේසි ඡේද අංක 8.3 අනුව, මාර්ග පුනරුත්ථාපන වැඩවල කිසියම් ප්‍රමාදයක් හඳුනාගැනීමට සංශෝධිත වැඩ සටහනක් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ යුතුය. 2013 දෙසැම්බර් 31 දිනට පුනරුත්ථාපන වැඩවල සියයට 47 ක අඩු ප්‍රගතියක් පෙන්නුම් කළ තිබුණද තිරුවානකැටිය- අගලවත්ත මාර්ගයේ පුනරුත්ථාපන වැඩවල නිරත කොන්ත්‍රාත්කරු එවැනි සංශෝධිත වැඩ සටහන් ඉදිරිපත් කර නොතිබුණි. එසේම මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා පරිසර ආරක්ෂණ සැලැස්ම කොන්ත්‍රාත්කරු පිළිපැද නොතිබුණු අතර සැලසුම් නොකළ මාර්ග පුනරුත්ථාපන වැඩ නිසා මතුවන අපහසුතා පිළිබඳව එම ප්‍රදේශයේ මාර්ග භාවිතා කරන්නන් හා පදිංචි කරුවන් පැමිණිලි සිදු කර තිබුණි. ඊට අමතරව දුර්වල මාර්ග නඩත්තුව සහ මාර්ග සංඥා ආදී අඩුපාඩු නිසා සමහර මාර්ග අනතුරු වාර්තා වී ඇති බවට බදුරලිය පොලීසිය ස්ථානභාර නිළධාරී ඔහුගේ 2013 ජනවාරි 15 දිනැති ලිපිය මගින් දන්වා තිබුණි.

(ඇ) උස්වැටකෙයියාව - එප්පාමුල්ල- පමුණුගම මාර්ගයේ පුනරුත්ථාපනය සඳහා ඇස්තමේන්තු පිරිවැය රු. 1,490,000,000 ක් වූ අතර එම පුනරුත්ථාපන වැඩ රු. 1,250,000,000 ක පිරිවැයකට අවසන් කර තිබුණි.රු.240,000,000 ක ඉතිරිය මීගමුව - ගිරිඋල්ල මාර්ගයේ දිග කිලෝමීටර 8.3 ක් පුනරුත්ථාපනය සඳහා භාවිතා කිරීමට ව්‍යාපෘති සම්බන්ධිකරණ කමිටුව තිරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) උස්වැටකෙයියාව - එප්පාමුල්ල- පමුණුගම මාර්ගයේ පුනරුත්ථාපනයේ විචලතාවයක් ලෙස මීගමුව - ගිරිඋල්ල මාර්ග පුනරුත්ථාපනය සලකා තිබුණි. කෙසේ වෙතත් මීගමුව - ගිරිඋල්ල මාර්ගය වයඹ පලාතේ වන අතර ඉහතින් දක්වන ලද මාර්ගයට සම්බන්ධයක් නොමැත.

(ii) මීගමුව - ගිරිඋල්ල මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්තුව මිල කැඳවීම් සිදු කිරීමකින් තොරව රු. 277,910,000 ක පිරිවැයකට පිරිනමා තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට රු. 351,915,000 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. තවද පුනරුත්ථාපන වැඩ 2013 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට අපේක්ෂිත වූ නමුත් 2013 දෙසැම්බර් 31 දිනට මාර්ග පුනරුත්ථාපන වැඩවල ප්‍රගතිය සියයට 65.65 ක් විය.

(iii) කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ උප ප්‍රාමාණික නිවැරදි කිරීමේ වැලි පැහැයීමේ ප්‍රතිකර්ම සඳහා ව්‍යාපෘතිය විසින් රු. 12,694,500 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් එය අය කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) අඩුපාඩු සහිත ඇතුරුම් යන්ත්‍රයක් භාවිත කරමින් බිබිල- උරණිය- මහියංගණ මාර්ගයේ කිලෝමීටර 29+800 සිට කිලෝමීටර 32+390 දක්වා ගල් කුඩු වලින් සමන්විත මතුපිට අතුරා තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ගයේ යෝග්‍යතාවය අනාරක්ෂිත හා අපහසු විය. ගල් කුඩු ස්ථරය ඉවත් කිරීමට හා අඩුපාඩු නිවැරදි කිරීමට උපදේශක කොන්ත්‍රාත්කරුට උපදෙස් දී තිබුණද 2014 ජූනි 30 දින වනවිටත් එය සිදුකර නැත.

**5.4 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

2007 අප්‍රේල් 5 දිනැති චක්‍රලේඛ අංක 33 හි ප්‍රතිපාදනයන්ට පටහැනිව උපදේශකවරු 04 ක් බඳවා ගෙන තිබුණු අතර එකතුව රු. 900,000 ක පාරිශ්‍රමිකයක් හා එකතුව රු. 1,920,000 ක ප්‍රවාහන දීමනා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා ඇති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියට ඔවුන්ගේ දායකත්වය අගය කිරීමට හැකිවන ලෙස කාර්ය සාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 322,326 ක දීමනා ගෙවා තිබු ව්‍යාපෘති සම්බන්ධිකරණ නිළධාරියකු විසින් කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.